# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
### 2011 අප්‍රේල් / මැයි

### මානවශාස්ත්‍ර පීඨය

### බෞද්ධ සංස්කෘතිය - BUCU- E1025

### බෞද්ධ මූලාශ්‍රය හා සාහිත්‍ය අධ්‍යයනය

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි

කාලය : පැය 03 යි

---

01. සමාජයීය ප්‍රශ්න විසඳීම සඳහා බුදුසමය ඉදිරිපත් කරන සංවිධාන සංකල්පය කුටදන්ත සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

02. බුද්ධචරිතයේ මානුෂික හා අතිමානුෂීය යන අංශ දෙකම මහාපරිනිබ්බාණ සූත්‍රයෙන් ප්‍රකට වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

03. ගිහි ආචාරධර්ම පැවිදි ආචාරධර්මයන්ගෙන් වෙනස් වන ආකාරය අදාළ මූලාශ්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.

04. රාජ්‍යත්වය පිළිබඳ බෞද්ධ ආකල්පයේ සුවිශේෂත්වය එහි සදාචාරාත්මක පදනම නිසා ප්‍රකට වන්නක් බව අදාළ මූලාශ්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

05. සාහිත්‍යය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වා එය මිනිස් ජීවිතයට වැදගත් වන්නේ ඇයිදැයි ප්‍රකට කරන්න.

06. අර්ථය හා රසය සමතුලිතව ඉදිරිපත් කිරීමෙන් පුද්ගල ජීවිතය යහමගට යොමු කිරීම බෞද්ධ සාහිත්‍යයේ පරමාර්ථය වී ඇති ආකාරය ජාතකකථා සාහිත්‍යය ආශ්‍රයෙන් පෙන්වා දෙන්න.

07. භාරතීය මහාකාව්‍ය සම්ප්‍රදාය බුදුසමයට අනුකූල කරනු පිණිස වංසකථා සාහිත්‍යය ගෙන ඇති පියවර මොනවාදැයි ප්‍රකට කරන්න.

08. සිංහල ගද්‍ය සාහිත්‍යයේ පෝෂණය උදෙසා බුදුසමයෙන් ලැබී ඇති අනුග්‍රහය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

09. බෞද්ධ උපදේශ සාහිත්‍යයෙන් අරමුණු වන සමාජ ජීවිතය පිළිබඳ විවරණයක යෙදෙන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් <u>දෙකකට</u> ප්‍රමාණවත් විවරණ සපයන්න.

    i. වෙස්සන්තර ජාතකය
    ii. බුදුගුණාලංකාරය
    iii. සක්කපඤ්හ සූත්‍රය
    iv. සෙබියා